**ශීර්ෂය - 287 ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව**

---------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවටඅදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1. 3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### 1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජුනි 27 දිනැති තක්සේරු වාර්තාව අනුව කොමසාරිස් ජනරාල්ගේ නිල නිවසේ තක්සේරු වටිනාකම රු.23,415,000 ක් ලෙස තක්සේරු කර තිබුණද 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එම ගොඩනැගිල්ලේ වටිනාකම රු.36,400,000 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම්හි වටිනාකම රු.12,985,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දීමෙන් පසු ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ නිල නිවස රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කරන ලද වටිනාකමට ගිණුම්ගත කොට මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවේ ඉඩම් තොරතුරු පද්ධතිය (E-Title System) 2020 වර්ෂයේ ස්ථාපිත කර ඊට අදාළව දරන ලද රු.1,900,000ක පිරිවැය මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් එම වටිනාකමෙන් 2023 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් වටිනාකම අඩු වී තිබුණි. | විගණනයෙන් පෙන්වා දීමෙන් අනතුරුව E-Title පද්ධතිය ස්ථාපනය කිරිම සඳහා දරන ලද පිරිවැය මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලදි. | එම |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 03 ක ප්‍රතිපාදනය වූ රු. 4,600,000 කින් ශුද්ධ ඉතිරිවීම් වටිනාකම රු.2,169,716 ක් විය. ඒ අනුව ඉතිරිවීම් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 34 ත් සියයට 60 ත් අතර පරාසයක පැවතුණි. | 2023/01/27 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2023 ප්‍රකාරව සියයට 6 ක පුනරාවර්තන ප්‍රතිපාදන අවුරා තැබීමට සිදුවීම මත මෙම වැය විෂයයන් යටතේ ප්‍රතිපාදන අවුරා තැබීම හේතුවෙන් මෙසේ ඉතිරිවීම් සිදුවී ඇති බව පෙන්වා දෙමි. | අවශ්‍යතාවය අනුව ප්‍රතිපාදන ඉල්ලුම් කල යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXIV පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය | 183,420 | ආපසු ගෙවා අවසන් කර නොමැති ණය මුදලින් අයකර ගැනීමට ඉතිරිව තිබෙන මුදල් නිලධාරීන්ගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිත මුදල්වලින් අයකර ගත යුතුය. තවද 2017 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 262/2017 හි 4 වන වගන්තිය අනුව 2018 වර්ෂයේ හා ඉදිරි වර්ෂවල විශ්‍රාම පාරිතෝෂිත ලබාදී ඇති නිලධාරීන්ගෙන් ශේෂයක් අත්තිකාරම් බී ගිණුමේ ඇතුළත් නොවීමට වගබලා ගත යුතු බව සඳහන් වුවද විශ්‍රාම ගිය නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය රු. 183,420 ක් වූ අතර එම ශේෂ මෙම වාර්තාව දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | ඉල්ලා අස්වූ තනතුරක සේවා කාලය විශ්‍රාම වැටුපට එකතු කිරීමට සිදුකළ ඉල්ලීමට මෙතෙක් විශ්‍රාම වැටුප් සැකසී නොමැති නිසා රජයට අයවිය යුතුමෙතෙක් අය කර ගැනීමට නොහැකි වී ඇත. දෙදෙනෙකුගේ ණය ශේෂ 2024 මැයි මස නිරවුල් කර ඇත. එක් අයෙකු වෛද්‍ය හේතු මත විශ්‍රාම ගොස් ඇතත් විශ්‍රාම වැටුප් සකස් කර ප්‍රදාන පත්‍රය පිරිනමා නොමැත. | ආයතන සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 262/2017 හි 4 වගන්තිය | 211,600 | 2018 වර්ෂය හා ඉදිරි වර්ෂවල මරණ පාරිතෝෂිත ලබාදී ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිඳු ණය ශේෂයක් තම ආයතනවල අත්තිකාරම් බී ගිණුමේ ඇතුළත් නොවීමට ආයතන ප්‍රධානීන් විසින් වගබලා ගත යුතුය යන්න සඳහන් කර තිබුණද 2023 දෙසැම්බර් 31 | මියගිය රියදුරු මහතාගේ වැන්දඹු අනත් දරු විශ්‍රාම වැටුප සැකසීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර ප්‍රදාන පත්‍රය පිරිනමා නොමැති බැවින් ණය ශේෂය නිරවුල් කිරීමට නොහැකි වී ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දින මාස 03 – 12 අතර මියගිය නිලධාරියෙකුගෙන් රු. 211,600 ක ණය ශේෂය මෙම වාර්තාවේ දින වන විටද නිරවුල් කර නොතිබුණි. | | |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර එය මහජනයාට විවෘත වන පරිදි ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පුරවැසි සේවා ලාභී ප්‍රඥප්තිය සකසා ඇති අතර එය ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල දැනුවත් කර ඇත. මේ වන විට ප්‍රාදේශීය කාර්යාලවල එය ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර ඇති අතර ප්‍රදර්ශනය නොකරන ලද කාර්යාල වල ද නොපමාව එය සිදු කරන ලෙස දැනුම් දී ඇත. | අදාළ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තිය ප්රදර්ශනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි මුදල් රෙගුලාසි අංක 371(5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් ගෙවන නිලධාරියා විසින් ස්වකීය අතුරු අග්‍රිමය පිළිබඳ ගණන් හිලව් ඉදිරිපත් කළ යුතු අතර අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත් 2023 වර්ෂයේ අවස්ථා 16 කදී නිකුත් කරන ලද එකතු වටිනාකම රු.442,795 ක් වූ අග්‍රිම නියමිත දිනට පියවා නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දිවයින පුරා ප්‍රාදේශීය කාර්යාල 53 ක සියළුම ගෙවීම් සිදු කරනු ලබන්නේ ප්‍රධාන කාර්යාලය මගිනි. යම් විශේෂිත අවස්ථාවන් සඳහා වියදම් දැරීමට අවශ්‍ය වූ විටෙක විධිමත් පරිදි තත්කාර්යය අතුරු අග්‍රිමයක් මඟින් එම වියදම් පියවා ගැනීමත් ඉන්පසු අග්‍රිමය පියවීමත් සිදු කරනු ලබයි. දින 10 ක් තුළ අත්තිකාරම පියවා ගැනීම ප්‍රායෝගිකව සිදුකිරීම අපහසු වන නමුත් අදාල වියදම් දැරීමෙන් පසු යම්කිසි මුදලක් ඉතිරිව් තිබේ නම් එය නොපමාව දෙපාර්තමේන්තු බැංකු ගිණුමට බැර කර ප්‍රධාන කාර්යාලය දැනුවත් කර වවුචර්පත් නොපමාව ඉදිරිපත් කොට පියවීම් සිදු කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන බවද වැඩිදුරටත් දැනුම් දෙමි. | අතුරු අග්‍රිම නියමිත දිනට පියවිය යුතුය. |

## 2.4 තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි අංක 571(2) හා (3) ඡේද ප්‍රකාරව වර්ෂ 2 කට වැඩි ඉකුත් වූ සියලුම තැන්පත් රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත් 2023 දෙසැම්බර් 31 දින වන විට රු. 1,322,816 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබෙන අතර මුදල් රෙගුලාසි උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්ට අයත් නිල නිවස සහිත ඉඩමේ පස් පුරවා ගෙබිම සකස් කිරිම සඳහා මෙම තැන්පත් මුදල තව දුරටත් තැන්පත් ගිණුමේ රඳවා ගෙන ඇත. ඒ සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත ඉල්ලීම් යොමු කර ඔවුන්ගේ දැනුවත් කිරිම් මත ඉදිරි කටයුතු සිදු කිරීමට අදාලවන ආයතනයන්ගේ නිර්දේශ ලබාගැනීමට මේ වන විට කටයුතු කරමින් පවති. | මුදල් රෙගුලාසි උපදෙස් ප්‍රකාරව කල් ඉක්මවු සියලුම තැන්පත් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1.1 කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | 2007 වර්ෂයේ සිට ඉඩම් අමාත්‍යාංශය යටතේ හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක වූ බිම්සවිය වැඩ සටහන සඳහා සමස්ත පිරිවැය රු.මිලියන 6,183.72 ක් වැයකර ඇතත් එම ආරම්භ අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි.මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i). | 1998 අංක 21 දරන හිමිකම් නිරවුල් කිරීමේ පනත සම්මත වීමෙන් අනතුරුව බිම් සවිය වැඩසටහන දිස්ත්‍රික්ක 03 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක ආරම්භ කර ඇති මෙම වැඩ සටහන 2023 දෙසැම්බර් 31 දින වන විට දිස්ත්‍රික්ක 20 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 87 ක පමණක් ක්‍රියාත්මක වෙමින් පැවතුණ ද අනෙකුත් දිස්ත්‍රික්ක ඇතුළත්ව ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කළහැකි කාලරාමුවක් දැක්වෙන ක්‍රියාකාරී සැලසුමක් සකස් කර නොතිබුණි | 1998 අංක 21 දරන හිමිකම් නිරවුල් කිරීමේ පනත සම්මත විමෙන් පසු ආරම්භ කරන ලද බිම් සවිය වැඩසටහන සඳහා කාල රාමුවක් 2008 වර්ෂයේ සකස් කර ඇත. මෙම සැලැස්ම පසු කාලිනව සංශෝධනය වී වෙනස් වී ඇති අතර මෙම වැඩසටහනට සම්බන්ධ සැලැස්ම සකස් කරන අවධියේ බලාපොරොත්තු වු මුල්‍ය ප්‍රතිපාදන වර්තමානය වන විට ද දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැත. එබැවින් ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි හිමිකම් නිරවුල් කිරීමේ කාර්යය ඉටුකිරිමට නොහැකි වී ඇත. අනුමත මාණ්ඩලික හා අනෙකුත් නිලධාරින් විශාල ප්‍රමාණයක පුරප්පාඩු පවතින බැවින්ද,මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අවශ්‍ය මිනින්දෝරුවන්ගේ පුරප්පාඩු | වැඩසටහන ක්‍රියාත්මක කළහැකි කාලරාමුවක් තුළ ක්‍රියාකාරී සැලසුම් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සම්පූර්ණ කිරීමට නොහැකිවීම හේතුවෙන් මැනුම් ගැටළු නොවිසඳීම, 13 විමර්ශන සඳහා නිළධාරින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැතිවීම, මැනුම් කටයුතු සඳහා මිනින්දෝරුවන් නොමැති වීම තුළින් තවදුරටත් මෙම ක්‍රියාවලිය ප්‍රමාද වෙමින් පවතී. කෙසේ නමුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 87 ක 2023.12.31 දින වනවිට මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. එමෙන්ම වර්තමානයේ මෙම ක්‍රියාවලිය කඩිනම් කිරීමේ වැඩපිළිවෙලක් ලෙස නිළධාරින් දිරිගැන්වීමේ ක්‍රියාවලියක්ද ඇතුලත් කර දස වසරක උපාය මාර්ගික සැලැස්මක් සකස් කර ඇත. | |
| (ii). | බිම්සවිය වැඩ සටහන 2002 දී හෝමාගම හා තඹුත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ආරම්භ කර වසර 21 කට ආසන්න කාලයක් ඉකුත්ව ගොස් තිබුණද, 2023 වර්ෂය වන විටත් අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි. | විමර්ශන කාර්ය භාරය, අධිකරණයෙහි පවතින නඩු හා අදාළ ඉඩම් හිමිකරුවන් දිවයිනෙන් බැහැරවීම වැනි අවස්ථාවලදී හිමිකම් විමර්ශන කටයුතු අවසන් කිරීමට නොහැකිවේ. තඹුත්තේගම, හෝමාගම කාර්යාලයන්හි මෙවන් ගොනු විශාල ප්‍රමාණයක් එක් රැස්ව ඇත. පනතේ 55 වන වගන්තිය යටතේ අවසන් කැමැත්තක් නොලියා මියයන අවස්ථාවලදී උරුමකරුවන්ට ඉඩම් පැවරීම යටතේ විමර්ශනය කර සහතික යොමු කිරීමද මෙම කාර්යාල මඟින් වර්තමානයේ සිදුවේ. | අපේක්ෂිත ප්‍රගතිය ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii). | මෙම වැඩසටහන ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 87 ට අදාළව මුළු ග්‍රාම නිලධාරී කොට්ඨාශ සංඛ්‍යාව 4728 ක් පැවතියද, ඉන් 1449 ක පමණක් එනම් සියයට 31 ක පමණක් මැනුම් අවසන් කර තිබුණි.එසේම කොට්ඨාශ 26 කට අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 974 ක කිසිදු මැනුම් කටයුත්තක් 2023 ඔක්තෝබර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. | ඉඩම් කොටස් සඳහා කැඩැස්තර සිතියම් සකස් කරනු ලබන්නේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසිනි. එම දෙපාර්තමේන්තුව බිම්සවියට අදාල කැඩැස්තර මැනුම් කටයුතු කරනු ලැබේ. කෙසේ නමුත් එම දෙපාර්තමේන්තුව විසින් ඒ ඒ කොට්ඨාස සඳහා මැනුම් ඉල්ලීම් යොමු කරනු ලබන්නේ එම කොට්ඨාසයට අදාලව අනුයුක්ත කර ඇති මිනින්දෝරුවන් සංඛ්‍යාව පදනම් කරගෙන වේ.එසේම මෙම මැනුම් සම්බන්ධයෙන් වන ප්‍රමාණයන් හා එම මැනුම් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම විසඳිය යුතු වනුයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින්ය. | |
| (iv). | බිම්සවිය වැඩසටහන අම්පාර, මුලතිව්, කිලිනොච්චිය, මන්නාරම හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල ආරම්භ කර නොතිබුණු අතර කිසිදු දිස්ත්‍රික්කයක සම්පූර්ණයෙන් මෙම වැඩසටහන ආරම්භ | 1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ නිරවුල් නොකරන ලද විශාල භූමි ප්‍රමාණයක් වසන ලද ගම් පැවතීම හේතුවෙන් මෙම දිස්ත්‍රික්ක තුළ බිම්සවිය වැඩසටහන ආරම්භ කිරීමට නොහැකි වී | අපේක්ෂිත ප්‍රගතිය ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර නොමැති වීම හේතුවෙන් මෙම මඟින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමේ බාධාවක් පවතින බව නිරීක්ෂණය විය. | ඇත. ඉඩම් මැනිම සඳහා ප්‍රමාණවත් මිනින්දෝරුවන් සංඛ්‍යාවක් අනුයුක්ත කිරීමේ හැකියාවක් නොමැති වීම. මුළු දිවයිනේ ඉඩම් කැබලි මිලියන 16 ක් පමණ පවතින බව ගණනය කර ඇත. එම ඉඩම් කැබලි ප්‍රමාණය මැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් නිලධාරින් 128 ක් හා බලයලත් මිනින්දෝරුවන් 72 ක ප්‍රමාණයක් පමණක් එක් වරකදි අනුයුක්ත කර ඇති බව නිරීක්ෂණය වේ.<br>ඒ අනුව සියලු මිනින්දෝරුවන් මැනුම් කටයුතු සිදු කල ද වර්ෂයකට මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන කඩයිම් සිතියම් වල අන්තර්ගත වනුයේ ඉඩම් කැබලි 50,000 - 60,000 ක් අතර ප්‍රමාණයක් පමණි. එබැවින් හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා සිතියම් ප්‍රමාණයේ හිගයක් පවතී. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවට අදාලව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන් හා සංවර්ධන නිලධාරි සේවයට අයත් විමර්ශන නිලධාරින් අනුයුක්ත කරන ලෙස කරන ලද ඉල්ලීම් සඳහා නිසි ප්‍රතිචාර නොලැබීම මත ඉතිරි දිස්ත්‍රික්ක සඳහා හිමිකම් නිරවුල් කිරීමේ කටයුතු කඩිනම් කිරිමේ ගැටළුකාරී තත්වයක් උද්ගතව ඇත. | |
| (v). | 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 12 වගන්තිය යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගැසට් කළ මුළු කැබලි සංඛ්‍යාව වූ 1,671,417 න් සියයට 58 ක් හෙවත් කැබලි 972,592 ක් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් විසින් අනුමත කර තිබුණද, සියයට 42 ක් මෙතෙක් අනුමත කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | 1998 අංක 21 දරන හිමිකම් නිරවුල් කිරීමේ පනතට අනුව ඉඩම් කොටස් සඳහා කැඩැස්තර සිතියම් සකස් කරනු ලබන්නේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසිනි. එම දෙපාර්තමේන්තුවට ප්‍රාදේශිය ලේකම්, ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් ලැබෙන හා වෙනත් රජයේ ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම්වලට අමතරව මැනුම් කටයුතු සිදු කරමින් ද මෙම දෙපාර්තමේන්තුව බිම්සවියට අදාල කැඩැස්තර මැනුම් කටයුතු කරනු ලැබේ. කෙසේ නමුත් මෙම දෙපාර්තමේන්තුව විසින් ඒ ඒ කොට්ඨාස සඳහා මැනුම් ඉල්ලීම් යොමු කරනු ලබන්නේ එම කොට්ඨාසයට අදාලව අනුයුක්ත කර ඇති මිනින්දෝරුවන් සංඛ්‍යාව පදනම් කරගෙන වේ.එසේම මෙම මැනුම් සම්බන්ධයෙන් වන ප්‍රමාණයන් හා එම මැනුම් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම විසඳිය යුතු වනුයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින්ය. | අනුමත නොවූ කැබලි අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi). | විවිධ ගැටළු හේතුවෙන් හිමිකම් සහතිකය නිකුත් කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිව ප්‍රාදේශීය කාර්යාල 85 ක 2023 දෙසැම්බර් 31 දිනට පසෙක තැබූ මුළු ගොනු සංඛ්‍යාව 490,327 ක් වූ අතර මෙම ප්‍රමාණය මෙතෙක් මැනුම් කර ගැසට් කර ඇති මුළු බිම් ප්‍රමාණය වූ 1,671,417 න් සියයට 29ක් පමණ විය.දෙපාර්තමේන්තුව විසින් පසෙක තබා ඇති ගොනු සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සහ ඒවා අධීක්ෂණය නිසියාකාරව සිදුනොවන බව නිරීක්ෂණය විය. | බිම්සවිය වැඩසටහන තුළ නිරන්තරයෙන් ගොනු පසෙක තැබීම සහ එම පසෙක තැබූ ගොනු නැවත නිරවුල් කර සහතික ලබා දීම සිදු වේ. මෙය චක්‍රීය වශයෙන් සිදු වන අතර සෑම විටම ගොනු ලක්ෂ 05 ක පමණ ප්‍රමාණයක් පසෙක ගොනු ලෙස නිරීක්ෂණය වේ.එසේ නමුත් මෙම ගොනු අධිකරණමය ක්‍රියාමාර්ග ලෙස විසඳීම හෝ විදෙස් ගත පුද්ගලයින් විමර්ශන කාර්යයට සම්බන්ධ වීම මත නිරවුල් ක්‍රියාවලියට නැවත යොමුව සහතිකපත් නිකුත් වේ. මෙම කාර්යය නිරන්තර අධ්‍යානයට ලක් කරමින් මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරන අතර පසුගිය වසර තුළ පමණක් පසෙක තැබූ ගොනු මඟින් තීරණ ලබා දීම 2022 දී 9376 ක් ද 2023 දී 8465 ක් පමණ ඉටු කර ගත හැකි වී ඇත. ඒ අනුව පුහුණු අවස්ථා, ඒකාබද්ධ පරීක්ෂණ හා නිරන්තර පසුවිපරම් මඟින් ක්‍රම ක්‍රමයෙන් පසෙක තැබූ ගොනු ප්‍රමාණයන් අඩු කරමින් සිටී. | පසෙක තැබූ ගොනු සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සහ අධීක්ෂණ කටයුතු නිසියාකාරව සිදු කළ යුතුය. |
| (vii). | බිම් සවිය කටයුතු සඳහා දෙපාර්තමේන්තුව දිවයින පුරා ප්‍රාදේශීය කාර්යාල 52ක් පවත්වා ගෙන යනු ලබන අතර ඒවා පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතන වල පවත්වා තිබුණි.2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එම කාර්යාල වල ගොඩනැගිලි කුලී හා ආරක්ෂක වියදම් වශයෙන් රු.246,884,260 ක මුදලක් ගෙවා ඇතත්, 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දරා ඇති ගොඩනැගිලි කුලී හා ආරක්ෂක සේවා වියදම් ලෙස රු.48,390,246 ක් වී තිබුණි. | මේ වන විට ස්ථාපිත කර ඇති කාර්යාල 53ක් අතරින් පුද්ගලික ගොඩනැගිලිවල ඇති කාර්යාල ගණන 27 ක් සහ අර්ධ රාජ්‍ය ගොඩනැගිලි වල කාර්යාල 04 ක් සඳහා කුලිය ගෙවනු ලබයි. රජයේ ගොඩනැගිලි වල කාර්යාල ගණන 22කින් කාර්යාල 04ක් සඳහා කුලිය ගෙවනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල රජය හෝ රජය අනුබද්ධ ආයතන වලට විතැන් වී වැයවන පිරිවැය අඩු කර ගැනීමට කටයුතු සිදු කරනු ලැබේ. 2023 ජනවාරි මස ප්‍රාදේශීය කාර්යාල 42ක් වෙත ආරක්ෂක වියදම් ගෙවන ලද අතර දැනට එම ආරක්ෂක සේවා සපයන කාර්යාල ගණන 34 දක්වා අඩු කර ආරක්ෂක සේවා සඳහා දරන වියදම අඩු කර ඇත. | 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරවවියදම් හැකිතාක් අවම කර ගත යුතුය. |
| (viii) | 1998 වර්ෂයේ සිට 2023දෙසැම්බර් 31 දක්වා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත හිමිකම් සහතික ලියාපදිංචිය සඳහා යවා ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව 779,691 ක් වන අතර එම කාර්යය අවසන් කර ලැබී ඇති හිමිකම් සහතික සංඛ්‍යාව 422,070 ක් වුවත් හිමිකම් සහතික 357,621 ක ප්‍රමාණයක කාර්යය අවසන් කර ලැබී නොතිබුණි. එම සහතිකපත් සම්බන්ධයෙන් වාර්තා පැවැත්වීමක් හෝ | පනතට අනුව භූමියේ සෑම බිම් ඒකකයක්ම මනිනු ලබයි. එනම් පෞද්ගලික ඉඩම් හා රජය සතු ඉඩම් (ඉඩම් භෞතික භූ දර්ශන - ගංගා, ඇළ මාර්ග, නිර්මිත බිම් ඒකක - මහාමාර්ග, මාර්ග) වෙන් වශයෙන් මැනීම සිදුකර පෞද්ගලික ඉඩම් සඳහා හිමිකම් සහතික නිකුත් කරනු ලබන අතර රජයේ ඉඩම් සඳහා හිමිකම් සහතික නිකුත් කරනු නොලැබේ.ඒ අනුව ලියාපදිංචිය සඳහා ඉඩම් කැබලි 779,691 ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත | නොලැබුණු සහතිකපත් සම්බන්ධයෙන් වාර්තා පවත්වා ගනිමින් කාලීනව පසු විපරම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පසු විපරම් කිරීමක් දෙපාර්තමේන්තුව සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. | යොමු කර හිමිකම් සහතික අදාල අයිති කරුවන් වෙත නිකුත් කිරීමකරනු ලැබේ. රජයේ ඉඩම් සඳහා සිදු වනුයේ හිමිකම උපලේඛන ගත කිරීම පමණක් වේ. එසේම උපලේඛන ලියාපදිංචිය පිළිබඳව පසු විපරම් කර සමායෝජක කමිටුවෙහිදී මේ පිළිබඳව සන්සන්දනය කිරීම සෑම සමායෝජක කමිටුවකදීම සිදු වේ. ඒ අනුව මෙම සංඛ්‍යාව සම්බන්ධයෙන් විධිමත් පසුවිපරමක් නිරන්තරයෙන් සිදු වන අතර හිමිකම් නිරවුල්කිරීමේ පනතේ 19 වන වගන්තිය යටතේ දක්වා ඇත්තේ රජයේ ඉඩම් සඳහා උපලේඛන නිකුත් කිරීම වේ. | |
| (ix) | 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 7(1) වගන්තියේ සඳහන් පරිදි නිශ්චිතව සඳහන් යම් ප්‍රදේශයක් තුළ වූ එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාශයක් සඳහා හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් සමගි මණ්ඩලයක් පත් කළ යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දින වන විට බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක දිස්ත්‍රික්ක, 87 හි ග්‍රාම නිලධාරි කොට්ඨාශ 4728 න් 532 කට පමණක් සමගි මණ්ඩල පත් කර තිබුණු අතර, ඉතිරි ග්‍රාම නිලධාරී කොට්ඨාශ 4,196 ක සමගි මණ්ඩල පත් කිරීමට කටයුතු කර නොමැති වීම සමස්ත ප්‍රගතිය අඩු වීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය. | සමගි මණ්ඩල පත් කිරීම තුලින් විමර්ශන කාර්යය පහසුවන අතර, අවස්ථානුකූලව විමර්ශන දත්ත ලබාගැනීම සමගි මණ්ඩල සාමාජිකයින් මගින් සිදු කරනු ලබයි. සමගි මණ්ඩල සඳහා නිලධාරින් නම් කර එවනු ලබන්නේ ග්‍රාම නිලධාරින් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගිනි. එක් එක් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරින් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සමගි මණ්ඩල සාමාජිකයින් නම් කර එවන ලෙස අංක 04/06/59 හා 2023.06.08 දිනැති ලිපිය මගින් අපගේ ප්‍රාදේශීය කාර්යාලවල නියෝජ්‍ය කොමසාරිස්වරුන්/සහකාර කොමසාරිස්වරුන් මේ වන විට දැනුම්වත් කර ඇත. සමගි මණ්ඩල පත් කරනු ලබන්නේ ඒ ඒ ග්‍රාමනිලධාරි කොට්ඨාශ සඳහා කැඩැස්තර සිතියම් ලැබීමෙන් අනතුරුව වන අතර එක් එක් ප්‍රාදේශීය කාර්යාල මගින් බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සියලුම ග්‍රාම නිලධාරි කොට්ඨාශ වලට නොවේ. තවද නම් කරනු ලබන කොට්ඨාශයක් සඳහා අවුරුදු 03 ක කාලයකට වලංගු වන පරිදි සමගි මණ්ඩල සාමාජිකයින් පත්කරනු ලැබේ | පනතේ විධිවිධාන ප්‍රකාරව සමගි මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේදී ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ පනතේ 14 වගන්තිය යටතේ වන තීරණ අතරින් ගැසට් මගින් ප්‍රසිද්ධ කිරීමට සැලසුම් කළ ඉඩම් කැබලි ප්‍රමාණය 200,000 ක් වුවද තත්‍ය වශයෙන් ගැසට් මගින් ප්‍රසිද්ධ කළ ඉඩම් ප්‍රමාණය 56,789 ක් විය. එය ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 28.3 ක ප්‍රමාණයකි. | එම ඉලක්කය ලඟාකර ගැනිම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මැනුම් කර ලබාදීමට නියමිත ඉඩම් කැබලි 70,350 ඉලක්කය වසර මැද වන විට ඉඩම් කැබලි 66,750 ලෙස සංශෝධනය වූ අතර අප වෙත මැනුම් කර ලබා දෙන ලද ඉඩම් කැබලි ප්‍රමාණය 59181 ක් වේ.2023 දෙසැම්බර් 31 දින වන විට එම ඉලක්කයෙන් ඉඩම් කැබලි 61,222 ක ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර, එහි ප්‍රතිශතය සියයට 61.22 ක් විය.මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මැනුම්කර ලබාදෙන ඉලක්කයෙන් 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරිම සිදුකල හැකි ප්‍රමාණය සියයට 60 ප්‍රමාණය ඉක්මවිමට හැකිවිම දෙපාර්තමේන්තු මට්ටමින් සතුටට කරුණකි. ඒ අනුව ප්‍රමාණාත්මකව වැඩි ප්‍රමාණයක් මැනුම් කර වසර මුල හෝ මැද අප වෙත ලබාදේ නම් මෙම ඉලක්ක තව දුරටත් වර්ධනය කරගැනීමේ හැකියාවක් පවති. | සැලසුම් කල ඉලක්කයන් ලගාකර ගැනිමටනිසි පරිදි සැලසුම් සකස් කර ක්‍රියා කළ යුතුය. |
| (ආ) | ඉඩම් හිමිකම් ලියාපදිංචිය සඳහා හිමිකම් සහතික නිකුත් කිරීමට ඉඩම් කැබලි 200,000 ක් අපේක්ෂා කර තිබුණද ඉඩම් හිමිකම් ලියාපදිංචිය සඳහා යවා තිබුණේ 47,271 කි. එය ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 23.6 ක ප්‍රමාණයකි. | පනතේ 14 වගන්තිය යටතේ හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරිම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උපලේඛන යැවීම 2023 ක්‍රියාකාරි සැලැස්ම අනුව සංශෝධිත ඉලක්කය ඉඩම් කැබලි 70,000 වන අතර 2023 දෙසැම්බර් 31 දින වන විට එම ඉලක්කයෙන් 47,271 ක ඉලක්කයක් කරා ලගාවී ඇති අතර එහි ප්‍රතිශතය සියයට 67.53 කි. මීන් රජයේ ඉඩම් කොටස් සඳහා හිමිකම් රෙජිස්ටරයේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පමණක් සිදුවන අතර හිමිකම් සහතික නිකුත් කිරිම සිදු වන්නේ පුද්ගලික ඉඩම් සඳහා පමණි. කෙසේවෙතත් හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය මෙම දෙපාර්තමේන්තුව පමණක් තනිව ඉටුකරන කාර්යයක් නොවන අතර දෙපාර්තමේන්තු කිහිපයක කාර්යයන් ඒ හා බැදිපවතී. | සැලසුම් කල පරිදි හිමිකම්ලියාප දිංචියසිදු කළ යුතුය. |
| (ඇ) | 1931 අංක 20 දරන පනතට අනුව ඉඩම් නිරවුල් කිරීමේ ආඥව ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යැවීමේ කාර්යභාරය සියයට 40 ක මට්ටමක පැවතුණි. | 2023 වර්ෂය සඳහා වූ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරි සැලැස්ම අනුව ඉඩම් නිරවුල්කිරීමේ ක්‍රියාවලියේදී පළාත් 03 ක නිරවුල් කිරීමේ දැන්වීම් 05කට අයත් භූමි ප්‍රදේශයක නිරවුල් කිරීමේ ආඥා පිළියෙළ කොට ගරු විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර තිබුණි.<br>ඉන් සේරුවිල කොටසක් යන ගම්වලට අදාළ නිරවුල් කිරීමේ ආඥාවන් පිළියෙළ කොට ගරු අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කිරීමට 2023 වර්ෂය තුළ හැකියාව ලැබුණු අතර අනෙක් ගම්වල | අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට කටයුතු කළ යුතුය. |

නිරවුල් කිරීමේ ආඥාවන් ගරු අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කිරීමට හැකියාව නොලැබුණි. ඊට ප්‍රධාන හේතුව ලෙස සඳහන් කළ හැක්කේ ඉහත සිතියම්වලට අදාළ මැනුම් විස්තර සහ " S " රේඛා චිත්‍ර මේ වන තුරු අදාළ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවලින් මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබීමයි. මේ සඳහා අවස්ථා ගණනාවකදීම ඉල්ලීම්, සිහිකැඳවීම් යොමු කළද තවදුරටත්රේඛා චිත්‍ර ලැබීම ප්‍රමාද වන බව නිරීක්ෂණය වේ. එසේ රේඛා චිත්‍ර නොලැබීමේ පසුබිමක ඉඩම් නිරවුල් කිරීමේ ක්‍රියාවලියේ ඉදිරි කිසිදු පියවරක් ඉහත ගම් තුනට අදාළව සිදුකළ නොහැකි වේ.

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය යටතේ ලියාපදිංචි කර තිබුණු අංක 65-0748 දරන ලැන්ඩ්රෝවර් ඩිපෙන්ඩර් රථය 2007 වර්ෂයේ සිට මෙම දෙපාර්තමේන්තුව යටතේ රාජකාරි සඳහා යොදාගෙන තිබුණ ද අදාළ අයිතිය පවරා ගැනීම සිදු කර නොතිබුණි. | අංක 65-0748 දරණ ලැන්ඩ් රෝවර් ඩිපෙන්ඩර් රථය මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අදාළ ලේඛන එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර හා කෘෂි කර්ම සංවිධානය වෙත භාර දී ඇති අතර තීරුබදු රහිත ආනයන කටයුතු සඳහා ශ්‍රී ලංකා රේගුව හා සම්බන්ධ කටයුතු මේ වන විට සිදුවන බව මා දැනුවත් කර ඇත. | කඩිනමින් අයිතිය පවරා ගැනීම කළ යුතුය. |

# 4. මානව සම්පත් කළමනාකරණය

## 4.1 අනුයුක්තකාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ. | රජයේ නව බඳවා ගැනීම් සීමා සහිතව සිදු කරනු ලබන අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු පුරවන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. පුරප්පාඩු පුරවන තෙක් වැඩ බැලීම/රාජකාරී ආවරණය සඳහා නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන් 14ක් පත් කර ඇත. දෙපාර්තමේන්තුවේ නිත්‍ය පත්වීම් ලද | පුරප්පාඩු සමාලෝචනය කර බඳවා ගැනීම කළ යුතුය. |

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | අතිරික්ත / පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
| --- | --- | --- | --- |
| ---------- | --------- | --------- | ------------ |
| ජ්‍යෙෂ්ඨ | 105 | 34 | 71 |
| තෘතියික | 07 | 05 | 02 |
| ද්විතියන | 1746 | 838 | 908 |
| ප්‍රාථමික | 254 | 149 | 105 |
| **එකතුව** | **<u>2112</u>** | **<u>1026</u>** | **<u>1086</u>** |

දෙපාර්මේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 71 ක්ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 02 ක්ද, ද්විතියක මට්ටමේ පුරප්පාඩු 908 ක්ද සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 105 ක්ද වශයෙන් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු සේවක සංඛ්‍යාව 1,086 ක් වූ අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් එනම් සියයට 51 ක් විය. එම පුරප්පාඩු 2024 අප්‍රේල් වන විට ද සම්පූර්ණ වී නොතිබුණි

නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන් 14ක් වැඩ බැලීම/රාජකාරී ආවරණය සඳහා පත් කර ඇත. තෘතියික මට්ටමේ , ද්විතියක මට්ටමේ සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් වලදී හෝ නිලධාරීන් ලබා දෙන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.